# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 20 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ **2006** මැයි මස **23** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 මැයි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 6.75 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2006 අංක 20 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මැයි මස 23 වන දින]

එල්. ඩී.— ඕ. 8/2005.

## (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2006 අංක 20 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

437 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

"සෙස් බදු අයකර ගැනීම.

7. (1) සමස්තයක් වශයෙන් රබර් කර්මාන්තයට අදාළ වන්නා වූ පිළිගත් කොන්දේසි සැලකිල්ලට ගනිමින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයක් මගින් අමාත්‍යවරයා නිශ්චය කරනු ලැබිය යුතු යම් ප්‍රමාණයකට සෙස් බද්දක් අයකරගනු ලැබ හෝ පනවනු ලැබ තිබිය යුතු ය. එසේ නිශ්චය කරන ලද සෙස් බද්ද මෙහි මින් මතු දක්වා ඇති ආකාරයට සහ අදාළ කාලයන්හි දී හඳුනාගත් රබර් නිෂ්පාදන සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් කිරීමේ දී පහත දැක්වෙන දෑ සම්බන්ධයෙන් අයකර ගනු ලැබිය යුතු සෙස් බද්දේ ප්‍රමාණය අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය:—

(අ) (i) අමු ස්වාභාවික රබර්;
(ii) කෘත්‍රිම රබර්; සහ
(iii) රබර් ආශ්‍රිත නිෂ්පාදන,

ආනයනය කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, ඒ නිෂ්පාදනවල වටිනාකම මත හෝ ඒ නිෂ්පාදනවල අඩංගු රබර් ප්‍රතිශතය මත ගණනය කිරීම සහ එසේ ගණනය කළ සෙස් බද්ද ආනයනය කරනු ලබන මොහොතේ දී ගෙවනු ලැබිය යුතු ය;

2-P L 001097- 4,500 (2006/03)

(ආ) (i) අමු ස්වාභාවික රබර්;

(ii) වියලි රබර්; සහ

(iii) අපනයනය සඳහා නිෂ්පාදිත රබර් ආශ්‍රිත නිෂ්පාදන,

අපනයනය කිරීමේ දී,ඒ නිෂ්පාදනයේ අඩංගු රබර් ප්‍රතිශතය මත ගණනය කිරීම සහ එසේ ගණනය කළ සෙස් බද්ද අවස්ථාවෝචිත පරිදි, රබර් නිෂ්පාදන නිෂ්පාදකයකු විසින් අමු රබර් මිලට ගන්නා මොහොතේ දී ම හෝ අපනයනය කරන මොහොතේ දී ගෙවනු ලැබිය යුතු ය;

(ඇ) දේශීය පරිභෝජනය සඳහා නිෂ්පාදිත රබර් ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී ඒ නිෂ්පාදනයේ අඩංගු රබර් ප්‍රතිශතය මත ගණනය කිරීම සහ එසේ ගණනය කරන ලද සෙස් බද්ද රට තුළ මිල දී ගන්නා අවස්ථාවේ දී ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සෙස් බද්දක් වශයෙන් පනවනු ලබන ප්‍රමාණය ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයක් මගින් අමාත්‍යවරයා විසින් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(4) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගයක් ගැසට් පත්‍රයේ ඒ නියෝගය පළකරනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය. සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයේ සිට මාස හතරක් ඉකුත්වීමට පෙරාතුව එයට අනුමතය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද කිසියම් නියෝගයක් ඒ යටතේ කලින් සිදුකරන ලද කිසිවකට අගතියක් නොමැතිව එය අනුමත නොකළ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ කිසියම් නියෝගයක් පරිච්ඡින්න කරන ලද දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) ඉහත කී උපවගන්තිවල නියමයන්ට අනුව ගණනය කළ සහ ගෙවන ලද සෙස් බද්ද 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ නියමයන්ට අනුකූලව අයකර ගන්නා ලද මුළු බදු මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය සහ රබර් ආශ්‍රිත සුළු සහ මධ්‍ය පරිමාණ දේශීය කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා සහ රබර් වගා කිරීම සඳහා 1969 අංක 36 දරන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විමසා ප්‍රයෝජනයට ගනු ලැබිය යුතු ය.

(8) සැකය මගහැරීම සඳහා මේ වගන්තියේ විධිවිධානවලට අදාළ වන්නා වූ, මෙයින් ප්‍රකාශිත සියලු රබර් අයිතමයන් 1991 ඔක්තෝබර් මස 1 වන දින අංක 682/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 91/11 දරන (ආර්. පී. ඕ.) ඒවා වර්ගීකරණය කරන ලද තීරු බදු පිළිබඳ නිවේදනය යටතේ අදාළ වන්නා වූ එච්.එස්. සංකේත අංකය හෝ ඒ වෙනුවට ආදේශ කරනු ලැබිය හැකි වෙනත් යම් සංකේත අංකයක් සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි අතර, එය යම් ඉදිරි දිනයක දී බලාත්මක විය යුතු ය.

"වැඩිපුර ගෙවන ලද සෙස් බදු මුදල් ආපසු ගෙවීම.

7අ. (1) යම් තැනැත්තකු විසින් වැඩිපුර ගෙවන ලද යම් සෙස් බදු මුදලක් ආපසු ලබාගැනීම සඳහා එම තැනැත්තා විසින්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) එම මුදල් ආපසු ගෙවීම සිදු කළ හැකි ද යන්න පිළිබඳව නිර්දේශයක් කරන ලෙස රබර්

නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලයෙන් ඉල්ලා සිටිමින්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ඉල්ලීම රබර් නැවත වගාකිරීමේ උපදේශක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) තීරණය කරනු ලබන නිර්නායකවල පදනම මත රබර් නැවත වගාකිරීමේ උපදේශක මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශ මත, නියම කරනු ලැබිය හැකි ආකාරයට මේ පනත යටතේ, එම තැනැත්තාට ආපසු ගෙවිය යුතු බවට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති මුදල ආපසු ගෙවන ලෙස අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(අඅ) අමු ස්වාභාවික රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් සහ ආනයනකරුවන් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදනවල නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම සඳහා යෝජනා ක්‍රමයක් පිහිටුවීම;

(අඅඅ) රබර්වල සහ රබර් ආශ්‍රිත නිෂ්පාදනවල රබර් අන්තර්ගත වන්නා වූ ආකාරය සහ විධි පිළිබඳ සහ ඒවායෙහි නිවැරදි ප්‍රතිශතයන් ද ප්‍රකාශ කරනු ලැබිය යුතු ය;”.

ප්‍රධාන ප්‍රඥප්තියට 10අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 10අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

“වැරදි.

10අ. මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවකට අනුකූලවීම උල්ලංඝනය කරන හෝ පැහැරහරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත

කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.”

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ “අමු ස්වාභාවික රබර්” යන යෙදුමේ අර්ථ නිරූපණය එයින් ඉවත් කර ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද සහ 2004 ඔක්තෝබර් මස 15 වන දින අංක 1362 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝගය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ගැසට් නිවේදනය පරිච්ඡින්න කළ යුතු බව.

**7**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.